14.2.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2.	රැස් කර තිබූ ආදායම්,තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3.	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් නිලධාරීන්ට පත්වීම් ලබා දීම.	අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3.	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1.	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි,පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	රටේ පැවැති ආර්ථික අර්බුධ හමුවේ මහ භාණ්ඩාගාරය විසින් අත්‍යාවශ්‍ය නොවන ව්‍යයම් කපාහැරීම	
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්	අනුකූල වේ		

	කොට තිබීම.			
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. SPCG/MT/A/DS/2/22/17

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 11 දින

16 MAY 2023

දිස්ත්‍රික් ලේකම්
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ශීර්ෂය 262 මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය **262** මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන 2023 මැයි 10 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට මම ප්‍රකාශ කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් ශේෂය රු.368,319,003 ක් වූ අතර, දෙපාර්තමේන්තු පොත්වල තැන්පතු ලැබීම් ශේෂය වූ රු.368,289,003 ක් සමඟ රු.30,000 ක වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ලැබීම් රු.368,289,003 ක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලැබීම් රු.368,319,003 ක්වූ අතර ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.30,000 ක මුදල්වල ශුද්ධ වෙනස්වීමක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව හා භාණ්ඩාගාර 82 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් 12 ක එකතුව රු.192,042,786 ක වෙනසක් විය.

(ආ) ඉකුත් වර්ෂය අවසානයේ සිගාස් අවසන් වාර්තාව අනුව මූල්‍ය නොවන වත්කම් කේතයන් 4 ක අවසාන ශේෂ සහ සමාලෝචිත වර්ෂයේ සිගාස් අවසන් වාර්තාව අනුව ආරම්භක ශේෂ සැසඳීමේදී ශේෂ අතර රු.5,504,735,698 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) උපලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිළියෙල කළ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.12,897,890 ක් වූ නමුත්, ගිණුම සමඟ ඉදිරිපත් කළ ඒසීඒ - 06 ආකෘතිය අනුව එය රු.128,968,940 ක් වූයෙන් රු.116,071,050 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ වත්කම් විවලන ලේඛනය අනුව අපහරණය කරන ලද වත්කම්වල හා අළුතින් එකතුකළ වත්කම්වල වටිනාකම පිළිවෙලින් රු.9,139,125 ක් හා රු.460,199,179 ක් විය. සිගාස් වත්කම් ලේඛනය අනුව එම අගයන් පිළිවෙලින් රු.9,836,490 ක් හා රු.518,033,053 ක් විය. ඒ අනුව අපහරණය කළ වත්කම්වල හා අළුතින් මිළදීගත් වත්කම් අතර පිළිවෙලින් රු.697,365 ක හා රු.57,833,874 ක වෙනසක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.1,044,607 ක් වූ අතර සිගාස් වත්කම් ලේඛනය අනුව එම අගය රු.1,143,693 ක් වූයෙන් රු.99,086 ක වෙනසක් පැවතුණි.

1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තැන්පතු ශේෂය රු.294,173,158 ක් හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.294,143,158 ක අගය සමඟ රු.30,000 කින් එකඟ නොවුණි.

1.6.4 ඒකාබද්ධ ශේෂ පිරික්සුම

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ ඒකාබද්ධ ශේෂ පිරික්සුමෙහි හර හා බැර ශේෂයන්ගේ එකතුව පිළිවෙලින් රු.12,266,103,436.55 ක් හා රු.12,266,073,436.55 ක් වූයෙන් රු.30,000 කින් එකඟ නොවුණි.

1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 57 ක් සඳහා 2022 ජූලි 06 දින රු.845,109 ක වියදමක් දරා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබූ නමුත් රක්ෂණ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවුණි.

1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොමැකිවීම

වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඇති රජයේ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ යාවත්කාලීන කරන ලද, තොරතුරු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා රු.5,421,095,000 ක ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබුණු අතර රු.4,453,667,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මාස 09 ක් සඳහා ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.135,630,000 ක් අඩුවෙන් අග්‍රිම ලැබී තිබූ අතර, එය රු.5,831,000 ක සිට රු.260,326,000 ක පරාසයක හෙවත් සියයට 2 සිට සියයට 45 ක පරාසයක පැවතුණි. සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි, මාර්තු හා දෙසැම්බර් මාස 03 සඳහා ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා රු.1,099,058,000 ක් වැඩියෙන් අග්‍රිම ලැබී තිබුණි. එය රු.11,010,000 ක සිට රු.109,467,000 ක පරාසයක හෙවත් සියයට 2 සිට සියයට 34 ක පරාසයක පැවතුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූලධන වැය විෂයයන් 06 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 91 දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී තිබුණි. තාත්විකවන සේ ඇස්තමේන්තු සකස් නොකිරීම හා ලබාදී තිබූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 06 කින් සියයට 2 සිට සියයට 24 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඇ) වැය විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 3 සිට සියයට 88 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශ 19 කින් හා දෙපාර්තමේන්තු 20 කින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.2,966,751,448 ක් හා රු.684,233,630 ක් ලෙස එකතුව රු.3,650,985,078 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.2,303,414,675 ක් හා රු.661,327,247 ක් ලෙස එකතුව රු.2,964,741,922 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.663,336,773 ක් සහ රු.22,906,383 ක් ලෙස එකතුව රු.686,243,156 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එය පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 3 ක් ලෙස සියයට 18 ක් විය.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළයුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින්, විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට සහතික වියයුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XXIV පරිච්ඡේදයේ 4.1 වගන්තිය	නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් සම්පූර්ණ ණය මුදල ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක නිලධාරියෙකු විශ්‍රාම යාමෙන් පසුව මාස 03 ත් 12 ත් අතර කාලයක් ගතව ඇති රු.820,393 ක් වූ ණය මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.
(ii) XLVIII පරිච්ඡේදය 6.2	නිලධාරියෙකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට අදහස් කරනවිට විනය බලධාරියා පත්කරනු ලබන නිලධාරී මණ්ඩලයක් විසින් මූලික විමර්ශන පැවැත්විය යුතු වුවත්, ඉකුත් වර්ෂ 2 හා සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක ග්‍රාම නිලධාරීන් 6 දෙනෙකුට එරෙහිව පැවත්වීමට නියමිත මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි.
(iii) XLVIII පරිච්ඡේදයේ 22.1 හා 2 උපවගන්තිය	විනය පරීක්ෂණ අනවශ්‍ය ලෙස ප්‍රමාද වන්නේ නම් ඒ පිළිබඳ ඒ අවස්ථාවේදීම විනය බලධාරියා විසින් විනය පියවර ගතයුතු වුවත්, කොරෝනා වසංගතය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූවන් සඳහා ලබාදෙන ප්‍රතිලාභ වංචා කිරීම හා කොරෝනා වසංගතය හේතුවෙන් රජය ලබාදුන් ආධාර මුදල් වංචා කිරීම යන විනය පරීක්ෂණ දිගුකලක් ප්‍රමාද වන බව නිරීක්ෂණය විය.
(iv) XLVIII පරිච්ඡේදයේ 1.2 ඡේදය	විනය බලධාරීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනෙකුත් ආයතන ප්‍රධානීන් විසින් විෂමාචාර ක්‍රියා සම්බන්ධව සිදුවන සියළු විනය පරීක්ෂණ ප්‍රමාදයෙන් තොරව සිදුකර ගැනීම වගකීමක් වුවද එම වගකීම නිසි ලෙස සිදුනොවීම හේතුවෙන් තාක්ෂණ නිලධාරීන්ට අල්ලස් ලබා නොදීම මත සංවර්ධන කටයුත්තකට මුදල් ගෙවීම ප්‍රමාද කිරීම, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියෙකු විසින් 2020

	වර්ෂයේ සිදුකර ඇති මූල්‍ය වංචාව හා රුහුණු විශ්ව විද්‍යාලයට අයත් ශිෂ්‍ය නේවාසිකාගාරය පිහිටි ඉඩමේ අනවසර ඉදිකිරීම යන විනය පරීක්ෂණ දිගුකාලයක් ප්‍රමාද වන බව නිරීක්ෂණය විය.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i) මුදල් රෙගුලාසි 215(3)(අ)	වැය විෂයයක ප්‍රතිපාදන ඉවත් කර තැන්පතු ගිණුමකට පැවරිය නොහැකි වුවත්, ඉකුත් වර්ෂයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක් ඉදිකිරීමේ ඉතිරි වැඩවලට අදාළව අවසන් බිල්පතෙහි වටිනාකම රු.2,280,883 ක්, 2021 දෙසැම්බර් 27 දින පොදු තැන්පත් ගිණුමට පවරා 2022 ජනවාරි 13 දින කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 751(5) හා 128(ඉ)	භාණ්ඩ, ගින්නෙන්, සොරා ගැනීමෙන්, දිරාපත් වීමෙන් හා අපතේ යාමෙන් හානි සිදුවීම වැළැක්වීමට නිසි පියවර ගනිමින් භාණ්ඩවල ආරක්ෂාව සඳහා විධිවිධාන යෙදිය යුතු නමුත්, හක්මණ සහකාර ප්‍රාදේශීය ලේකම් නිළ නිවස දැඩි ලෙස අබලන්වීම මත එහි ඇති භාණ්ඩවලට හානිවීම වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 754 හා 758	බඩු වට්ටෝරු පොත වර්ෂය අවසානයේදී තුලනය කර ඉදිරියට ගෙන නොතිබූ අතර පෙර වර්ෂයේ ශේෂ ඉදිරියට ගෙන ඒමේදී වෙනස්කම් සිදුකර තිබුණි.
(iv) මුදල් රෙගුලාසි 757(2)(අ)	හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තැපැල් මුද්‍රණ යන්ත්‍රයක හා රේඩියෝ යන්ත්‍රයක ඌණතාවයන් නිරීක්ෂණය වි තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.
(v) මුදල් රෙගුලාසි 1645(අ) හා 1646	මාසික දෛනික ධාවන සටහන් අදාළ මාසයට පසු ඊලඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථමයෙන් මාසික සාරාංශ සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 5 ක දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019	
• 02(i) ඡේදය	කිසියම් විෂමාචාරයක් සම්බන්ධ මූලික විමර්ශනයක් පැවැත්වීම මාස 02 ක් ඇතුළත නිමකළ යුතු වුවද පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ග්‍රාම නිලධාරීවරයෙකු හා කළමනාකරණ සේවා නිලධාරිණියක සම්බන්ධ මූලික විමර්ශනය හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ මූලික විමර්ශනය ආරම්භ කර මාස 06 කටත් වඩා වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.
• 2(iii) ඡේදය	විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස 06 ක් ඇතුළත නිමකළ යුතු වුවත් 2020 හා 2021 වර්ෂවල ආරම්භ කළ විධිමත් විනය පරීක්ෂණ 5 ක්, 2022 දෙසැම්බර් 31 දින වනවිට වසරකට වඩා වැඩි කාලයක් ගත වී ඇතත්, නිමකර නොතිබුණි.
(ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ iv ඡේදය	ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවය කළ කාලය සනාථ කර නොගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක නිලධාරීන් 09 දෙනෙකු වෙත 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා එකතුව රු.629,139 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.
(iii) 2022 මාර්තු 25 දිනැති අංක 5/2022 දරන චක්‍රලේඛයේ 03 ඡේදය	වාහන අළුත්වැඩියා නියමිත පරිදි සිදුකර ඇති බවට මෝටර්රථ පරීක්ෂකගේ නිර්දේශ ලබාගත යුතු වුවත් කැබරථයක් අළුත්වැඩියාව සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.6 තැන්පතු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.16,755,886 ක් වූ වසර 02 ක් ඉක්මවූ තැන්පතු 121 කට අදාළ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් රු.6,209,204 ක් වූ තැන්පතු 12 ක් වසර 05 ඉක්මවා තිබුණි. කඹුරුපිටිය බොක්ෂින් ක්‍රීඩාගාරය හා වොලිබෝල් ක්‍රීඩාගාරය ඉදිකිරීමට 2020 ජූලි 20 දින ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබුණු රු.9,157,993 ක මුදලින්, 2021 අගෝස්තු 10 දින එම කාර්යය සම්පූර්ණයෙන් නිමකර ඉතිරි වූ රු.1,892,509 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2021/2022 මහ කන්නයේ දී ගෘහ ආර්ථික හා පෝෂණය වැඩිදියුණු කර, පවුල් ඒකක සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ රු.459,000 ක් වැයකර ප්‍රතිලාභීන් 102 දෙනෙකුට කිකිළි පැටවුන් 10 බැගින් බෙදාදී තිබුණි. කිකිළි පැටවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බලා කටයුතු නොකිරීම හා ව්‍යාපෘතිය සම්බන්ධ පසු විපරම් නොකිරීම නිසා කිකිළි පැටවුන් මියයාම මත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී දරන ලද වියදම නිශ්ඵල වී තිබුණි.

(ආ) ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ හක්මණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 34 ක තෝරාගත් එළවළු වර්ගයන්ගෙන් එක් බඳුනක් බැගින් ඇසුරුම් කර ලබාදීම වෙනුවෙන් තවාන්කරුවන් 30 දෙනෙකුට රු.862,470 ක් ගෙවා තිබුණි. නිසි සැලැස්මක් හා පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම මත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී තිබුණි.

(ඇ) සමෘද්ධි පවුල් ලක්ෂ 2 ක් කේන්ද්‍ර කරගත් අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 198 දෙනෙකු වෙත ව්‍යාපාරික උපකරණ, කුරුඳු පැල හා තේ පැල ලබාදී තිබුණි. 2022 නොවැම්බර් 24 දින භෞතික පරීක්ෂාවේදී කුරුඳු පැල ලබාගත් ප්‍රතිලාභීන් වගාව නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. සමෘද්ධි වසම් 2 ක ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබාදී තිබූ තුනපහ ඇඹරීමේ යන්ත්‍ර 02 ක් භාවිතයට ගෙන නොතිබුණි. නිසි විශ්ලේෂණයකින් තොරව ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඈ) වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි කලාප 3 ක ග්‍රාම නිලධාරී වසම් 8 ක සිදුකළ නියැදි පරීක්ෂාවේදී 1995 සිට 2012 දක්වා සමෘද්ධි සහනාධාරය ලබාගත් මාසික ආදායම රු.10,000 ට අඩු ප්‍රතිලාභීන් 442 දෙනෙකු සහ හක්මණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කලාප 03 ක ප්‍රතිලාභීන් 2437 දෙනෙකු 2022 වර්ෂය අවසානය දක්වාම එම සහනාධාරය ලබාගෙන තිබුණද සමෘද්ධිලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වී නොතිබුණි.

(ඉ) සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිඵාදන යටතේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය

(i) වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම නිලධාරී වසම් 2 ක් ආවරණය වන පරිදි රු.586,000 ක් වැයකර ප්‍රතිලාභීන් 27 දෙනෙකුට ලබාදී තිබුණු කුකුල් පැටවුන් 1465 ක් මියයාම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. රු. 5,903,065 ක ප්‍රතිපාදනයෙන් රු.4,929,000 ක් වැයකර එළවළු නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ග්‍රාම නිලධාරී වසමක් සඳහා GI බට 930 ක් මිලදීගෙන තිබුණි. එම බටවලින් රු.683,700 ක් වටිනා GI බට 129 ක් අදාළ

ව්‍යාපෘතිය සඳහා භාවිතයෙන් තොරව මාස 10 කට අධික කාලයක් නිශ්කාර්යව ගබඩාවේ පැවති බැවින් එම ව්‍යාපෘතියන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ii) පොදු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.5,970,732 ක මුදලක් ලැබී තිබුණු අතර එක් ග්‍රාම නිලධාරී වසම් 02 ක ඇල මාර්ගය සංවර්ධනයට හා ජනාවාසයට ප්‍රවේශවන මාර්ගය සංවර්ධනය කිරීමට රු.2,985,366 ක් වෙන්කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වනවිට ඇල මාර්ගය සංවර්ධනයට රු.518,878 ක් උපයෝජනය කර ඉතිරි රු.2,466,488 ක් ද, ජනාවාසයට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය නොකිරීම නිසා ඉතිරි රු.2,466,488 ක්ද සමඟ එකතුව රු.5,451,854 ක මුදල ආපසු යවා තිබුණු බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(iii) කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසමක සාම්ප්‍රදායික ගෘහස්ථ කුඹල් කර්මාන්තයේ I අදියර සඳහා රු.1,075,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2021 අප්‍රේල් 20 දිනැති මාර්ගෝපදේශ සංග්‍රහය 2021/1 ට අනුව ගම්මාන තෝරා ගැනීමේදී අමුද්‍රව්‍ය බහුලව පැවතීම කෙරෙහි අවධානය යොමුකළ යුතුව තිබුණි. නමුත් මැටි ලබා ගැනීමේ හිඟයක් පවතින බව හම්බන්තොට ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු සඳහන් කර තිබුණි. මැටි ඇඹුරුම් යන්ත්‍රය සවිකිරීම හා අනෙකුත් වියදම් ලෙස රු.916,725 ක් වැයකර යන්ත්‍රය ස්ථාපිත කර තිබුණි. මැටි කර්මාන්තයේ නියුතු 49 දෙනෙකු සඳහා යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කළ ද අමුද්‍රව්‍ය හිඟතාවය හා නිෂ්පාදනය අලෙවි කර ගැනීමේ ගැටළුව හේතුවෙන් යන්ත්‍රය ප්‍රයෝජනයට ගන්නා පුද්ගලයින් ගණන 15 කට සීමා වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණු වන නිෂ්පාදනය දිරිමත් කිරීම, විරැකියාව අඩුකිරීම හා චක්‍ර රැකියා ජනිත කිරීමේ අරමුණ අපේක්ෂා කළ ආකාරයට ඉටුවී නොතිබුණි.

(iv) හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති 07 ක් සඳහා රු.5,421,709 ක රජයේ දායකත්වය හා රු.1,715,755 ක ප්‍රතිලාභී දායකත්වය ද සමඟ එකතුව රු.7,137,464 ක වියදමක් දරා තිබුණි. ග්‍රාම නිලධාරී වසමක ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා රු.301,423 ක රජයේ දායකත්වය යටතේ ලබාදුන් පළතුරු පැල සතුන් හානි කර තිබුණි. ප්‍රතිලාභීන්ට ලබාදුන් ජල මෝටර් 02, තාච්චි 05, වීල්බැරෝ 04, උදළු තල 03, අලවංගු 01, මල්බාල්දි, ජලනල හා ජල ටැංකි යන උපකරණ නිශ්ක්‍රීයව නිවෙස්වල තිබුණි. ග්‍රාම නිලධාරී වසමක බුලත්, අන්නාසි, රසකැවිලි නිෂ්පාදනය සඳහා ප්‍රතිලාභීන් 72 දෙදෙනෙකු වෙනුවෙන් රු.1,2018,299 ක් වැයකර තිබුණද වගාවන් විනාශ වීම සහ නිෂ්පාදන අලෙවිකර ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපෘති අසාර්ථක වී තිබුණු අතර මෙම ව්‍යාපෘති පිළිබඳව ආර්ථික සංවර්ධන නිලධාරීගේ පසුවිපරම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

3.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මාර්ගයක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.58,452,745 ක ඇස්තමේන්තුගත වටිනාකමකට විවෘත මිල කැඳවීම් කර තිබුණි. අවම මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු සමඟ රු.50,840,253 ක වටිනාකමක් යටතේ දින 240 ක් ඇතුළත නිමකිරීම සඳහා 2019 ජුනි 21 දින ගිවිසුම්ගතවී තිබුණි. ඉදිකිරීම් සුරක්ෂණ අරමුදලෙන් ලබාගෙන තිබූ අත්තිකාරම් බැඳුම්කරය මත 2019 ජූලි 08 දින රු.9,790,151 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. සංවර්ධනය කළයුතු මාර්ගයට ප්‍රවේශ වියයුතු මාර්ගය බාහිර බලපෑම් හේතුවෙන් අවහිර වී තිබුණු අතර වෙනත් විකල්ප මාර්ගයක් නම්කර තිබුණ ද පිරිවැය අධිකවීම මත කොන්ත්‍රාත්කරු විසින් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා තිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අත්තිකාරම් මුදලින් මූලික වැඩ වෙනුවෙන් සහතික කළ බිල්පත් වටිනාකම අඩුකර ඉතිරි මුදල වූ රු.8,415,304 ක මුදල වාරික 12 කින් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවී තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින වනවිටත් රු.1,352,750 ක මුදලක් අය කර ගෙන නොතිබුණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙනියාය සංචාරක බංගලාවේ පිවිසුම් මාර්ගය II අදියරෙහි ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කාර ආයතනයක් සමඟ 2021 මැයි 18 දින රු.2,744,262 ක් වටිනා ගිවිසුමකට අත්සන් කර තිබුණි. ව්‍යාපෘතියේ අවසන් වැඩ වාර්තාව අනුව රු.2,551,127 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය නිමකළ යුතු දිනය 2021 අගෝස්තු 18 දින වුවද ව්‍යාපෘතිය නිමකර තිබුණේ 2022 අප්‍රේල් 05 දින දීය. ප්‍රවේශ මාර්ගයට ඇතිරීම සඳහා ප්‍රමිතියෙන් අඩු අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් යෙදීම වෙනුවෙන් රු.697,529 ක් වැයකර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට රු.2,500,000 ක තක්සේරු වටිනාකම සහිත ප්‍රාදේශීය ලේකම් හා සහකාර ප්‍රාදේශීය ලේකම් නිළ නිවාස පිළිවෙලින් 2006 හා 2002 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ලක්, කුඩා ශ්‍රවනාගාරයක් ලෙස සංවර්ධනය කිරීමට රු.986,474 ක් වැයකර තිබුණි. එම ගොඩනැගිල්ල කිසිදු ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පවතින බව විගණන දිනය වූ 2023 පෙබරවාරි 08 දින නිරීක්ෂණය වූ අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විදාතා මධ්‍යස්ථානය සඳහා පෞද්ගලික ස්ථානයක් කුලී පදනම මත පවත්වාගෙන යාම වෙනුවෙන් 2022 වර්ෂයේදී රු.218,000 ක මුදලක් ගෙවා තිබුණි.

3.3 පාඩු හා හානි

(අ) 2021 ජූනි 13 දින මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපන ශාලාවේ ඇතිවූ ගින්න හා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වතුර මෝටරයක් අස්ථානගතවීම සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර සිදුවූ හානිය තක්සේරු කර මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 56 ක රක්ෂණාවරණය සඳහා නියමිත දිනට ප්‍රසම්පාදන කටයුතු නොකිරීම නිසා දින 08 ක් වෙනුවෙන් රු.43,836 ක අමතර මුදලක් වියදම් කර පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබූ අතර ගෙවීම් ප්‍රමාද කිරීම හේතුකොටගෙන මුදල් රෙගුලාසි 210(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

(අ) 2016 - 2021 අතර කාලය තුළ අවස්ථා කිහිපයකදී පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලද ප්‍රතිපාදන රු.9,149,964 ක් වැය කරමින් අත්පත්දු ක්‍රීඩාංගන 04 ක් ඉදිකර තිබුණ ද එම ක්‍රීඩාංගනවලින් රු.6,823,091 ක් වැයකර ඉදිකරන ලද ක්‍රීඩාංගන 03 ක් විගණන දිනය වූ 2023 ජනවාරි 25 දින වනවිට ද භාවිතයට නොගන්නා බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ප්‍රගති වාර්තා අනුව හක්මණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සමෘද්ධි ණයලාභීන් 168 දෙනෙකුගෙන් කල්පසුවූ ණය රු.12,013,438 ක් හා බොල් ණය රු.5,851,388 ක ණය අයකර ගැනීමේ කාර්යය වෙනුවෙන් ව්‍යාපෘති කළමනාකරුවන් 04 දෙනෙකු වෙත රු.222,000 ක මුදලක් ගෙවා තිබුණ ද අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 23 කට අදාළව විගණන දිනය වූ 2023 අප්‍රේල් 21 දින වනවිටත් පිළිතුරු ලැබී නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් සභාවට අයත් වාහනයක් 2022 වර්ෂයේදී නඩත්තු හා අළුත්වැඩියාව සඳහා එකතුව රු.155,955 ක් වැයකර තිබූ අතර එම වියදම් දිස්ත්‍රික් ලේකම් වැය ශීර්ෂයෙන් දැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් ලැබී නොතිබූ අතර එය මුදල් රෙගුලාසි 136 හා 137 ට පටහැනි බව නිරීක්ෂණය කෙරේ.

(ආ) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 49 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් රු.1,251,121 ක් ගෙන

තිබුණ ද ක්ෂේත්‍ර රාජකාරිවලදී ඉටුකළ රාජකාරිය සම්බන්ධ විධිමත් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහනට අදාළව 2021 දෙසැම්බර් 15 දිනැති MF/NDD/02/2021 දරන මුදල් චක්‍රලේඛය පරිදි පසුවිපරම් කටයුතු සිදු නොකිරීම හා ප්‍රතිලාභීන් වෙත තාක්ෂණික දැනුම ලබා නොදීම මත පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි පුද්ගලයින් දෙදෙනෙකුට ලබාදුන් රු.138,750 ක් වටිනා පොල්තෙල් නිෂ්පාදන යන්ත්‍රය, රු.63,500 ක් වටිනා බිම්මල් වගා මළු පිරවුම් යන්ත්‍රය හා සමෘද්ධි සමිතියකට ලබාදුන් රු.295,000 ක් වටිනා කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රය ඵලදායී කාර්යයකට යොදා නොගන්නා බව 2023 ජනවාරි 24 හා 25 දෙදින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුරුතමුරය නැගෙනහිර ඉලංගවත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.882,780 ක මුදලක් ගොවි සංවිධානයකට ගෙවා තිබුණි. වැඩ විෂය අංක 02 අනුව ABC අතුරා ඝනවත් කිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා නොගෙන රු.116,207 ක් ගෙවා තිබුණි.

(ඉ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෙරුවේවෙල ඉදිකැටිය කෝංගහහේන මාර්ගය සංවර්ධනයට අදාළව ABC ඇතිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමිතියක් වෙත රු.35,479 ක් ගෙවා තිබුණද ඒ පිළිබඳ තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. ඇස්තමේන්තුවේ අංක 09, 14, 15 යන වැඩ විෂයයන් වෙනුවෙන් රු.24,031 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් කර තිබුණද මාර්ගය පැත්තේ දිගින් මීටර් ½ ක් හා පළලින් මීටර් 0.3 ක කොටසක් ගැලවී තිබූ අතර එම කාර්යය වෙනුවෙන් රු.65,990 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) සමෘද්ධි පවුල් ලක්ෂ 2 ක් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 26 ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභීන් 110 දෙනෙකු සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 145 ක් බෙදාදීම සඳහා 2021 දෙසැම්බර් 31 දින රු.304,710 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධව 2022 අගෝස්තු මස 29 දින සිදුකළ පරීක්ෂාවේදී අඩු වයස් පැටවුන් ලබාදීම, විවිධ රෝගවලට ගොදුරුවීම, එන්නත් ලබානොදීම හා කුකුල් කෑම මිළ ඉහළයාම වැනි හේතු නිසා එම පැටවුන්ගෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් මියගොස් තිබූ අතර මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගෙන නොතිබුණි. හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රජයේ දායකත්වය ලෙස රු. 1,311,770 ක මුදලක් ලැබී තිබුණ ද රු.1,966,154 ක් වැය කිරීම හේතුවෙන් අනුමත මුදල් ප්‍රමාණය ඉක්මවා රු.654,384 ක් වැයකර තිබුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කට අදාළ සමෘද්ධි බැංකුවල ණය අයවීමේ ප්‍රගති වාර්තා අනුව ණයලාභීන් 2318 කට කල්පසුවූ ණය රු.160,138,051 ක් හා බොල් ණය රු.13,368,993 ක් අයකර ගැනීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඌ) සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් ගේ 2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/10 දරන චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂයේදී උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් සිප්දොර ශිෂ්‍යාධාර ලබාදිය යුතු වුවත්, හක්මණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 2 ක ගණිතය ඇතුළු තවත් විෂයයන් අසමත් සිසුන් 8 දෙනෙකු වෙත 2020 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා එකතුව රු.291,000 ක ශිෂ්‍යාධාර ගෙවා තිබුණි.

(එ) ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 කින් තොරතුරු කැඳවන ලදි. 2023 මාර්තු 24 දින වනවිට විගණනයට තොරතුරු ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ට අදාළව ලියාපදිංචි කරන ලද ග්‍රාම ශක්ති ජනතා සමිති 146 න් 2022 දෙසැම්බර් 31 දින වනවිට ජනතා සමිති 99 ක් අක්‍රීය මට්ටමේ පැවති අතර එම සමිතිවල රු.36,293,148 ක තැන්පතු ද ක්‍රියාකාරී මට්ටමේ පවතින සමිති 47 ක තැන්පතු ලෙස රු.23,906,661 ක් ද ඇතුළුව එකතුව රු.60,199,809 ක ශේෂයක් රාජ්‍ය බැංකුවල තැන්පත් කර තිබුණු අතර ව්‍යාපෘති ක්‍රියාකාරකම් නවතා දැමීම නිසා එම මුදල් නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. අභ්‍යන්තර පාලන පද්ධති දුර්වලවීම නිසා අදාළ ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් 2018 හා 2019 වර්ෂවල මේ වෙනුවෙන් දරන ලද රු.63,104,643 ක් වූ වියදම ද නිශ්කාර්ය ව පැවතුණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණින් ආරම්භ කරන ලද ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය වසර අවසානයේදී අතරමඟ නවතා දැමීම නිසා පුළුල් අරමුණකින් ආරම්භ කළ මෙම ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය කෙරේ.

4 තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 අප්‍රේල් 28 දිනැති අංක MSDW/08/65 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2030 වර්ෂය වනවිට රාජ්‍ය ආයතන ලඟාකර ගතයුතු ඉලක්ක හා අරමුණුවල ප්‍රගතිය මැන බැලීමට අදාලව නිශ්චිත දර්ශක හඳුන්වාදී තිබූ අතර නිළ සංඛ්‍යාන විද්‍යාත්මක මූලධර්මයන්ට අනුව එම දර්ශක ආදායම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, ජන වර්ගය, සංක්‍රමණික තත්ත්වය, ආබාධිත භාවය සහ භූගෝලීය ස්ථානගත වීම හෝ වෙනත් ලක්ෂණ අනුව වෙන්කොට දැක්විය යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ තිරසර සංවර්ධන සැලැස්ම හා ප්‍රගතිය තුල කාර්යාලයට අදාළ වන අරමුණු 17 ක් හඳුනාගෙන තිබුණද, ඊට අදාලව චක්‍රලේඛය මඟින් පෙන්වාදී තිබූ නිශ්චිත දර්ශක හඳුනාගෙන ඒවායේ ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන හා ඉලක්ක ලඟාකර ගැනීමට අදාළව වාර්ෂිකව ලඟාකර ගතයුතු අරමුණු හා ඉලක්කවල දර්ශක මට්ටම ඇගයීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මකවී නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තෘතීයික මට්ටමේ තනතුරක එක් නිලධාරියෙක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතීයික මට්ටමේ තනතුරුවල සේවකයින් 460 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරක එක් නිලධාරියෙක්ද වශයෙන් මුළු අතිරික්ත නිලධාරීන් 462 දෙනෙකු විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් තොරව සේවයේ නියුක්ත කර තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) 2017 සැප්තැම්බර් 20 දිනැති අංක 4/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහකිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මියයාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්ය මණ්ඩල වෙනස්වීම් යාවත්කාලීන කර සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.

අත්සන් කළේ :

බී. ජී. අසේල ඉඳුනිල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, - කාරුණික දැනගැනීම

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

බී.ජී. අසේල ඉඳුනිල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය